අනුරාධපුර මහා නගර සභාව

# Anuradhapura Municipal Council

පරිපාලන වාර්තාව - 2022 වර්ෂය

# Administration Report – Year 2022


<u>අපගේ දැක්ම :</u>

"අභිමානවත් පුරවරයක්, තෘප්තිමත් ප්‍රජාවක්"

<u>අපගේ මෙහෙවර</u> :

"අනුරාධපුර මහා නගර සභා සීමාව තුල ජීවත් වන නගරවාසීන් මුල්කර ගනිමින් සහ නගරය පරිහරණය සඳහා පැමිණෙන නාගරික පාරිභෝගකයින්ගේ සුබ විහරණය සඳහා දැනට මහා නගර සභාව සතු සියළුම සම්පත් භාවිතා කරමින්, මහජන හිතකාමී, පරිසර හිතකාමී සහ නෛතික පැවැත්මක් සහිත යෝජනා සමූහයක් නගරය තුල ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රශස්ථ මට්ටමක පවත්වාගෙන යාම"

<u>පරිපාලන ව්‍යුහය :</u>



## මහා නගර සභා බල ප්‍රදේශය :

ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන උතුරු මැද පළාතේ ප්‍රධාන පරිපාලන දිස්ත්‍රික්කය වන ඓතිහාසික අනුරාධපුර නගරයේ ප්‍රධාන පළාත් පාලන ආයතනය වන අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශය වර්ග කිලෝමීටර් 36.32 කින් සමන්විත වේ. 2022 වර්ෂයේ දී ජනගහනය 67,088 ක් වන අතර, මහා නගර සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 22 ක් ඇතුලත්ව ඇත.

මහා නගර සභා බල ප්‍රදේශයේ කාපට් ඇතිරූ මාර්ග කි.මී.49.4 ක් ද, තාර ඇතිරූ මාර්ග කි.මී. 85.57 ක් ද, පවතින අතර බොරළු ඇතිරූ මාර්ග කි.මී. 61.6 ක් හා කොන්ක්‍රීට් කරන ලද / කුට්ටි ගල් ඇතිරූ මාර්ග කි.මී. 15.17 ක් ද සංවර්ධනය කිරීමට යෝජිතව ඇත.

## අනුරාධපුර මහා නගර සභාවේ ඉතිහාසය :

1938 දී සංස්ථාපිත පැරණි අනුරාධපුර නගර සභාව, 1961 ජුලි 19 දින විසුරුවා හැරීමෙන් පසු, 1961 අංක : 32 දරණ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනතින් 1961 ජුලි 20 දින සිට අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය පිහිටුවන ලදී. මෙම පනතේ 02 ඡේදය යටතේ මුළු නගර සභාවේ සියළු බලතල වලට අමතරව පුරා විද්‍යා ස්ථාන නඩත්තුව, ආරක්ෂාව හා ප්‍රතිසංස්කරණය, නව නගරය ඇති කිරීම, නිවාස තැනිම වැනි නගර සභාවකට අයත් නොවන බලතල හා කාර්යයන් ද පැවරී තිබුණි. 1975 ජනවාරි මස 31 වන දින සංරක්ෂණ මණ්ඩලය විසුරුවා හැරීමෙන් පසු නැවතත් අනුරාධපුර නගර සභාව පිහිටුවන ලදී. වසර 26 ක නගර සභා පාලනයකින් පසුව 2000 ජුලි 25 දිනැති අංක : 1142/3 දණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2001 අප්‍රේල් මස 15 දින සිට අනුරාධපුර මහා නගර සභාවක් බවට ප්‍රකාශයට පත් කරන ලදි.

එතැන් සිට 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනත යටතේ ක්‍රියාත්මක වන ලද අනුරාධපුර මහා නගර සභාවේ 04 වන සැසි වාරය 2018 මාර්තු මස 09 වැනි දිනැති අංක : 2061/42-20 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තෝරා පත්කර ගත් සභිකයින් 14 දෙනෙකුගෙන් හා තෝරා එවා ඇති සභිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත මහා සභාව 2018 මාර්තු මස 05 දිනැති අංක : 2061/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව 2018 මාර්තු මස 20 වන දින සිට ආරම්භ කර මේ දක්වා පවත්වාගෙන යනු ලබයි.

## පරිපාලන කටයුතු :

252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතට අනුව මහා නගර සභාවේ ප්‍රධාන විධායක නිලධරයා ලෙස නගරාධිපති ද, ප්‍රධාන පරිපාලන බලධරයා ලෙස නාගරික කොමසාරිස් ද කටයුතු කරනු ලබයි.

මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව සමග විවිධ විෂයයන් යටතේ පවත්නා ස්ථාවර කමිටු 05 ක් මගින් මහා සභාව වෙත අදහස් හා යෝජනා සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබයි.

අනුරාධපුර මහා නගර සභාවේ 04 වන සැසි වාරයේ :

- නගරාධිපතිවරයා ලෙස එච්.පී. සෝමදාස මහතා ද
- නියෝජ්‍ය නගරාධිපති ලෙස එම්.ඩබ්ලිව්. බුද්ධික ප්‍රේමදාස මහතා ද
- නාගරික කොමසාරිස් ලෙස ඩබ්ලිව්.එම්. රුවන් විජේසිංහ මහතා ද වර්තමානයේ කටයුතු කරනු ලබයි.

අනුරාධපුර මහා නගර සභාවේ 2022 වර්ෂයේ ප්‍රථම මහා සභාව 2022 ජනවාරි මස 11 වන දින පැවැත්වූ අතර, එහිදී ස්ථාවර කමිටු සඳහා පහත සඳහන් පරිදි සභිකයින් තේරී පත් විය

- මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව :
  ගරු නගරාධිපති එච්.පී. සෝමදාස මහතා - සභාපති (නිල බලයෙන් සභාපති ධූරය හිමි වේ)
  එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මහතා - සාමාජික
  එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මහතා - සාමාජික
  නදීර ප්‍රභාත් ධර්මදාස මහතා - සාමාජික
  සමන් ප්‍රියන්ත ජයවර්ධන මහතා - සාමාජික
  ටී.එම්. ධර්මසේන මහතා - සාමාජික
- සෞඛ්‍ය , පරිසර, කෘෂිකර්ම හා රථවාහන කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව :
  සුසිල් තිලකරත්න මහතා - සභාපති
  එම්.පී.එම්. අන්සාර් මහතා - සාමාජික
  සුපුනි සඳමාලි මිය - සාමාජික
  සුරංගි ආර්. සමරතුංග මිය - සාමාජික
  සීතා හේරත් මිය - සාමාජික
  විමල් රවින්ද්‍ර රණසිංහ මහා - සාමාජික
- නව ආයෝජන ආදායම් ප්‍රවර්ධනය ඉඩම් හා දේපල නිරවුල් කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව :
  ජේමසිරි හෙට්ටිආරච්චි මහතා - සභාපති
  නලින් සිරිවර්ධන මහතා - සමාජික
  ඩී.ජී. ප්‍රේමදාස මහතා - සාමාජික
  කේ.ඒ. ඉන්ද්‍රාණි මිය - සාමාජික
  රංජිත් රාජකරුණා මහතා - සාමාජික
  නිර්මලී ප්‍රියදර්ශනී මිය - සාමාජික
- කාන්තා හා ළමා කටයුතු, සමාජ සවිබල ගැන්වීම් හා ජීවනෝපාය සංවර්ධන කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව :
  සුපුනි සඳමාලි මිය - සභාපති
  සුරංගි ආර්. සමරතුංග මිය - සාමාජික
  සචිනි නිමේෂා මිය - සාමාජික
  කේ.ඒ ඉන්ද්‍රාණි මිය - සාමාජික
  නිර්මලී ප්‍රියදර්ශනී මිය - සාමාජික
  සීතා හේරත් මිය - සාමාජික
- යටිතල පහසුකම්, නිවාස , පුස්තකාල හා තොරතුරු තාක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව :
  විමුක්ති රණවීර මහතා - සභාපති
  විනෝදනී විජේසූරිය මිය - සාමාජික
  සචිනි නිමේෂා මිය - සාමාජික
  ශිවන්ත මලික් කුමාර මහතා - සාමාජික
  නුවන් චතුරංග මහතා - සාමාජික
  අල් ෆාරිස් මහතා - සාමාජික
- ආගමික සංස්කෘතික ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව
  ඉන්දික් හෙන්දාවිතාරණ මහතා - සාමාජික
  ඩී.ඩී. රටියල මහතා - සාමාජික
  විනෝදනී විජේසූරිය මිය - සාමාජික
  රෝෂන් ඉස්මත් බුහාරි මහතා - සාමාජික

අසේල ඉන්දික විජේසිංහ මහතා - සාමාජික
ප්‍රභාත් කීර්ති වැවේගෙදර මහතා - සාමාජික

මහා නගර සභාවේ 2022 වර්ෂයේ අවසන් මහා සභාව දෙසැම්බර් මස 06 වන දින පැවැත් වූ අතර, 2023 වර්ෂය සඳහා අය වැය සම්මත කර ගැනීමේ විශේෂ සභාව 2022 දෙසැම්බර් මස 13 දින පවත්වන ලදී.

ඒ අනුව නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති ඇතුළුව සභිකයින් 28 දෙනෙකුගෙන් සමන්විත මහා සභාව මගින් ලබාදෙනු ලබන මූල්‍යමය හා පරිපාලනමය තීරණ ක්‍රියාත්මක කිරීමේ පහසුව සඳහා අනුරාධපුර මහා නගර සභාව පහත සඳහන් පරිදි දෙපාර්තමේන්තු 04 කට බෙදා වෙන් කර ඇත.

1. නාගරික පරිපාලන දෙපාර්තමේන්තුව
2. නාගරික මුදල් දෙපාර්තමේන්තුව
3. නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
4. නාගරික සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙම දෙපාර්තමේන්තු 04 සඳහා පවරනු ලැබ ඇති විෂයයන්ට අදාලව එම දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ අධීක්ෂණය යටතේ කාර්යයන් ඉටු කරනු ලබන අතර, මෙම සියළු කාර්යයන් පිළිබඳව නාගරික කොමසාරිස් වෙත වාර්තා කළ යුතුවේ.

<u>නාගරික පරිපාලන දෙපාර්තමේන්තුව :</u>

අනුරාධපුර මහා නගර සභාවේ විවිධ තනතුරු වලට අදාලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද ස්ථිර කාර්ය මණ්ඩලය 596 ක් සිටිය යුතු වුවත්, මෙම වර්ෂයේ දී ස්ථිර කාර්ය මණ්ඩලය 382 ක් හා පුරප්පාඩුව පවත්නා සුළු සේවක පුරප්පාඩු හේතුවෙන් මහා සභා තීරණ මගින් බඳවා ගන්නා ලද අනියම් කාර්ය මණ්ඩලය 182 ක් සේවයේ යෙදී සිටී. මෙම සියළු කාර්ය මණ්ඩලයන්හි පෞද්ගලික ලිපිගොණු යාවත්කාලීනව පවත්වාගෙන යාම ඇතුළු සියළු පරිපාලන කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් අධීක්ෂණය පරිපාලන නිලධාරි විසින් සිදුකරනු ලබයි.

මහා සභාව කැඳවීම, සභා තීරණ නිකුත් කිරීම ඇතුළු මහා සභාවට අදාල සියළු කටයුතු පරිපාලන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන අතර, සභා ලේකම්වරයෙකුගේ (නාගරික ලේකම් හා නියෝජ්‍ය නාගරික කොමසාරිස්) පුරප්පාඩුව වසර ගණනාකවක සිටම පවතී. තව ද 2022 වසර තුල මිය ගිය හා විශ්‍රාම ගැන්වීම යන කරුණු හේතුවෙන් මාණ්ඩලික, මාණ්ඩලික නොවන හා කණිෂ්ඨ කාර්ය මණ්ඩලයන්හි මුළු පුරප්පාඩු සංඛ්‍යාව 214 ක් වේ.

නාගරික පරිපාලන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පාලනය වන සියළුම අංශයන් සඳහා 2022 වර්ෂයට පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා වෙනුවෙන් 2022 අය වැය මගින් වෙන්කර ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.126,143,643 කි.

## නාගරික මුදල් දෙපාර්තමේන්තුව :

අනුරාධපුර මහා නගර සභාවේ වාර්ෂික අය වැය සකස් කිරීම්, ආදායම් රැස් කිරීම් ඇතුළු සියළු මුල්‍යමය කටයුතු මුදල් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. **2020 හා 2021 වර්ෂයන් හි රට තුල පැවති කොවිඩ් 19 වසංගත රෝගය වැනි අයහපත් සෞඛ්‍ය තත්වයන් මත වුවද, වරිපනම් බදු, වෙළඳ බලපත්‍ර, මුද්දර ගාස්තු, කුලී ආදායම්, සේවා ආදායම් ඇතුළු විවිධ ආදායම් ක්ෂේත්‍රයන් ඔස්සේ අනුරාධපුර මහා නගර සභාවට රු.මි. 400 ක පමණ ආදායමක් රැස් කර ගැනිමට හැකි විය. නමුත් 2022 වර්ෂයේ රු.මි. 568 ක පුනරාවර්ථන ආදායමක් අපේක්ෂා කරන ලදි.**

**2021 දෙසැම්බර් මස 15 දින පැවති අය වැය සම්මත කරගැනීමේ විශේෂ මහා සභා රැස්වීමේ දි 2022 වාර්ෂික අය වැය සම්මත කරගන්නා ලදී.**

**ඒ අනුව 2022 වර්ෂය තුල ලැබුණු මුළු පුනවරාවර්තන ආදායම හා ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණය රු.603,475,163 කි.**

**2022 වර්ෂය තුල පුනරාවර්තන, ප්‍රාග්ධන හා ණය වාරික ගෙවීම් ඇතුළුව සත්‍ය වියදම රු.585,992,782 කි.**

- **විශේෂයෙන්ම රාජ්‍ය මුදල් හා ගිණුම් පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (Association of Public Finance Accounts of Sri Lanka) මගින් පවත්වන ලද රාජ්‍ය ආයතනයන් හි හොඳම ගිණුම් හා වාර්ෂික වාර්තා - 2020 සඳහා හිමි රිදී සම්මානය අනුරාධපුර මහා නගර සභාව වෙත , 2022 දෙසැම්බර් මස 02 වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්2020 වර්ෂයේ මුල්‍ය කාර්ය සාධනය වෙනුවෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලැබු ප්‍රශස්ථ වාර්ෂික කාර්යය සාධන වාර්තා හා ගිණුම් සම්මාන තරගාවලීය මහා නගර සභා වෙනුවෙන් පිරිනමන ලද රිදී සම්මානය 2022 වර්ෂයේ දෙසැම්බර් 02 වන දින හිමි වීම විශේෂ කරුණකි.**


CA
THE INSTITUTE OF
CHARTERED ACCOUNTANTS
OF SRI LANKA


CA
APFA
Association of Public Finance Accountants of
Sri Lanka (APFASL)
The Public Sector Wing of CA Sri Lanka
Awards for
SILVER AWARD


CA
THE INSTITUTE OF
CHARTERED ACCOUNTANTS OF SRI LANKA
APFA
Best Annual Reports and Accounts Awards
for Public Sector - 2020
Public Sector - Municipal Councils Category
SILVER AWARD
AWARDED TO
Anuradhapura Municipal Council
On 02nd December 2022 in Colombo
By The
Association of Public Finance Accountants of
Sri Lanka ( APFASL),the Public Sector Wing of
CA Sri Lanka
V. Kanagasabapathy
PRESIDENT, APFASL
Asela Athapathu
SECRETARY, APFASL
ASSOCIATION OF PUBLIC FINANCE ACCOUNTANTS OF SRI LANKA

➢ **2022 වර්ෂය තුළදී ERP පරිගණක තොරතුරු පද්ධතිය ස්ථාපිත කර ගැනීමට හැකිවීම ද විශේෂිත වූ ජයග්‍රහණයකි.**



නාගරික මුදල් දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පාලනය වන සියළුම අංශයන් සඳහා 2022 වර්ෂයට පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා වෙනුවෙන් 2022 අය වැය මගින් වෙන්කර ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.43,111,762 කි.

<u>නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව :</u>

නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නගර සීමාව තුල බෝවන රෝග පැතිරීම වැලැක්වීම, ජලභීතිකා රෝග නිවාරණ කටයුතු පාසල් සෞඛ්‍ය වැඩසටහන්, ආහාර පරීක්ෂාව ඇතුළු නාගරික ජනතාවගේ සෞඛ්‍ය තත්වය යහපත් ආකාරයට පවත්වාගෙන යාම සඳහා උපකාරී වන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

විශේෂයෙන්ම කසල කලමනාකරණය , කාබනික පොහොර නිපදවීම, කසල ප්‍රතිචක්‍රීයකරණය වැනි වැඩසටහන් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

කොවිඩ් 19 වසංගත රෝග තත්වය පැවති කාල වකවානුව තුල ද සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් රෝග නිවාරණය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අතර,

- නගරයේ පොදු ස්ථාන වල විෂබීජහරණය කිරිම.
- දැත් සේදීම සඳහා සුදුසු ස්ථාන පිළියෙල කිරීම.
- එන්නත්කරණය සාර්ථකව සිදු කිරීම.
- PCR හා ඇන්ටිජන් පරීක්ෂාව සිදු කිරීම.
- නිරෝධායන කටයුතු සිදු කිරීම.
- මහජනතාව සඳහා අවශ්‍ය සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් ලබා දිම.
- කොවිඩ් 19 රෝග නිවාරණ රාජකාරි කටයුතු වල යෙදෙන කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂිත ඇඳුම්, මුව ආවරණ, විෂබීජහරණ දියර, පා ආවරණ ඇතුළු සියළු අවශ්‍යතාවයන් සපයා දිම, ආදී මහජනතාවගේ සහ කාර්ය මණ්ඩලයේ සුභසාධන කාර්යයන් සිදු කරන ලදී.

ඒ අනුව 2021 හා 2022 වර්ෂ තුල සිදුකරන ලද මුළු PCR හා ඇන්ටිජන් පරීක්ෂණ සංඛ්‍යාව 18,229 කි.

2021 හා 2022 වර්ෂයන් තුල දී නිසල නිම්නය ආදාහනාගාරය තුල සිදු කරන ලද ;

- කොවිඩ් මරණ ආදාහනය සඳහා ලැබුණු සංඛ්‍යාව - 306
  - නගර සිමාව තුල ගාස්තුවෙන් නිදහස් කල මරණ සංඛ්‍යාව - 38
  - නගර සීමාව තුල ගාස්තු අය කල මරණ සංඛ්‍යාව - 04
  - නගර සීමාවෙන් පිටත ගාස්තු අය කල මරණ සංඛ්‍යාව - 264

කොවිඩ් මළ සිරුරු ආදාහනය කිරීම සඳහා මහා නගර සභාව සතු ආසියාවේ විශාලතම සුසාන භූමිය වන නිසල නිම්නය ආදාහනාගාරයේ කාර්ය මණ්ඩලය විශාල කාර්ය භාරයක් ඉටු කරන ලදී. කොවිඩ් මළ සිරුරු නිවසට රැගෙන යාමට පවා නොහැකි ලෙස නීති පනවා තිබූ අවධියක මහා නගර සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හා ආදාහනාගාරයේ කාර්ය මණ්ඩලය විසින් ලබා දුන් සහාය ඉතාමත් අගය කළ යුතු කරුණකි. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් අධීක්ෂණය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් සිදුකරනු ලබයි.

මෙම කොවිඩ් 19 වසංගත රෝග තත්වය පාලනය කිරීම සඳහා චීනයේ ලින්ෆෙන් නගර සභාව මගින් ද අනුරාධපුර මහා නගර සභාව සඳහා විශේෂ පරිත්‍යාගයන් සිදු කරන ලදි.

නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පාලනය වන සියළුම අංශයන් සඳහා 2022 වර්ෂයට පොදු පරිපාලනය හා සෞඛ්‍ය සේවා වෙනුවෙන් රු. 15,488,522 ක් ද, කසල කලමනාකරණය වෙනුවෙන් රු.190,804,287 ක් ද, රෝග වැලැක්වීම සඳහා රු.7,051,898 ක් ද, ආදාහනාගාර සේවා වෙනුවෙන් රු.4,367,000 ක් ද වශයෙන් රු.217,711,707 ක මුදලක් 2022 අය වැය මගින් වෙන්කර ඇත.

<u>නාගරික සංවර්ධනදෙපාර්තමේන්තුව :</u>

අනුරාධපුර මහා නගර සභා බල ප්‍රෙද්ශය තුල ඇති මාර්ග, කාණු, මංමාවත්, ගොඩනැගිලි, ඉඩම්, ක්‍රීඩා භූමි සංවර්ධනය කිරීම ඇතුළු පොදු සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි.

- අනුරාධපුර මහා නගර සභාවේ මහජන පුස්තකාලය සඳහා වසර ගණනාවක සිට අඩුපාඩුවක්ව පැවති නාම පුවරුව සඳහා අළුතින් මූර්තියක් නිර්මාණය කර නාම පුවරුව සැකසීම මෙම වර්ෂය තුල දී සිදුකරන ලදී.
- මහා නගර සභාව සතු පණ්ඩුකාභයපුර ක්‍රීඩා පිටිය දිවා රාත්‍රී තරඟ පැවැත්වීමට සුදුසු ආකාරයට විදුලි පහන් යොදා සකස් කිරීම ද මෙම වසර තුල දි සිදුකරන ලදී සංවර්ධන කාර්යයකි.
- මහා නගර සභාව සතු සියළුම වාහන සේවා කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා වාහන සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම ද මෙම වසර තුල සිදු වූ විශේෂිත කාර්යයකි.

විශේෂයෙන් රට තුල පැවති කොවිඩ් 19 වසංගත රෝග තත්වය හමුවේ වුව ද, නාගරික ජනතාව වෙනුවෙන් නගරයේ සියළු මංමාවත්, කාණු නඩත්තුව ඇතුළු මහජන සුභසාධනය උදෙසා සිදුකල යුතු සියළු කාර්යයන් ඉටු කරන ලදී. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් අධීක්ෂණය ඉංජිනේරු විසින් සිදු කරනු ලබයි.

| | | |
|---|---|---|
| ➢ 2022 වර්ෂය තුල නඩත්තු කරන ලද මාර්ග සංඛ්‍යාව | - | 19 |
| ➢ ක්‍රීඩා පිටි සංඛ්‍යාව | - | 01 |
| ➢ වීදි පහන් අළුත්වැඩියාව | - | 5,400 |
| ➢ නව වීදි පහන් සවිකිරීම් | - | 13 |
| ➢ පොදු පහසුකම් අළුත්වැඩියා හා නඩත්තු ප්‍රමාණය | - | 06 |

නාගරික සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවත්නා සැලසුම් අංශය මගින් නාගරික ජනතාව වෙනුවෙන් පහත සඳහන් පරිදි කාර්යයන් ඉටු කරන ලදී.

- අඩු ආදායම්ලාභී පවුල් වල පාසල් ළමුන් සඳහා නොමිලයේ පාසල් පොත් බෙදාදීම.
- 2022 මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් විවිධ වැඩසටහන් පැවැත්විම. (ගර්භනී මවුවරුන් සහා පෝෂණ මළු බෙදාදිම, සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.)
- ලෝක ළමා දිනය වෙනුවෙන් දරුවන් සඳහා චිත්‍ර තරඟ පැවැත්වීම.
- වැඩිහිටි දිනය වෙනුවෙන් රු.2500/= ක තැන්පතුවක් සමග ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරිකිරීමේ ගිණුම් පාස්පොත් ලබාදිම.
- අක්ෂි සායන පවත්වා ඇස් කණ්නාඩි ලබා දිම.
- ළමා නිවාස වල දරුවන් සඳහා පාසල් පොත් ලබාදීම.
- විශ්‍රාමිකයින්ගේ සේවය ඇගයීමේ වැඩසටහනක් 2022 දෙසැම්බර් මස ක්‍රියාත්මක කිරීම.

නාගරික සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පාලනය වන සියළුම අංශයන් සඳහා 2022 වර්ෂයට පොදු පරිපාලනය , මහජන උපයෝගීතා සේවා හා සුභසාධන සේවා වෙනුවෙන් රු. 136,431,261 ක මුදලක් 2022 අය වැය මගින් වෙන්කර ඇත.

<u>මහජන පුස්තකාලය</u>

උතුරු මැද පළාතේ පැරණීතම වූ අනුරාධපුර මහා නගර සභාව සතු මහජන පුස්තකාලය 1951 මැයි මස 23 දින ආරම්භ කරන ලද අතර, 1959 සැප්තැම්බර් මස 12 දින ශ්‍රී ලංකාවේ ප්‍රථම ළමා පුස්තකාලය එහි ආරම්භ කරන ලදී.

මහජන පුස්තකාලය සතුව මේ වන විට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පොත් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් මහජනතාවගේ පරිහරණය පිණිස වෙන්කර ඇති අතර පහත සඳහන් අංශයන් වලින් සමන්විත වේ.

- පොත් බැහැර දෙන අංශය
- ළමා අංශය
- විමර්ශන අංශය
- පුවත්පත් අංශය
- වාර සඟරා අංශය
- අධ්‍යයන අංශය,
- පරිගණක අංශය
- විශේෂ එකතු අංශය (1956 වර්ෂයේ සිට විවිධ තොරතුරු ඇතුලත් ලේඛන, පොත්පත් අඩංගු වේ)

❖ මෙම පුස්තාලය සතුව දූර්ලභ ගණයේ පොත් එකතුවක් සංරක්ෂණය කර ඇත. ලංකා ඉතිහාසය, පුරා විද්‍යාව, බෞද්ධ දර්ශනය හා කලා ශිල්ප පිළිබඳව දූර්ලභ ගණයේ පොත් එකතුවක් සංරක්ෂණය කර ඇති අතර, පර්යේෂන කටයුතු හා අධ්‍යයන කටයුතු සඳහා මෙම පොත් එකතුව වඩාත් වැදගත් වේ.

2022 වර්ෂය තුල ආරම්භ කරන ලද විශේෂ අංශ :

- ➢ දෘශ්‍යාබාධිත සාමාජිකයින් සඳහා වූ බ්‍රේල් අකුරු භාවිතා කල හැකි අංශය
- ➢ ජංගම පුස්තකාල සේවාව.

ඩබ්ලිව්.එම්. රුවන් විජේසිංහ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
අනුරාධපුර.